SLGURU.LK
ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone

ගම්පහ අධ්‍යාපන කලාපය
Gampaha Education Zone

දෙවන වාර ඇගයීම - 2025
Second Term Evaluation - 2025

ශ්‍රේණිය Grade	12	විෂයය Subject	නර්තනය (දේශීය) I (52)	කාලය Time	පැය 02

නම : .....

I කොටස

❖ සියළුම ප්‍රශ්න වලට වඩාත් ගැලපෙන පිලිතුර තෝරා ඊට අදාල ප්‍රශ්නය ඉදිරියේ ඇති වරහන තුල ලියන්න.

(01) මයුරා වන්නම ඉදිරිපත් කරනු ලබන තිත් රූපය දක්වෙන වරණය වන්නේ,
(1) 1 2 / 1 2 / 1 2 / 1 2 3 4
(2) 1 2 / 1 2 / 1 2 3
(3) 1 2 / 1 2 / 1 2 3 4
(4) 1 2 3 / 1 2 3 / 1 2 3 4
(5) 1 2 / 1 2 3 / 1 2 3 4 (.....)

(02) පිළිවෙළින් පහතරට, උඩරට සහ සබරගමු වන්නම් වන්නේ,
(1) කොවුලා, මුසලඩි, ශුද්ධ තාලය වේ
(2) මුසලඩි, නළු ගීතිකා, තිසරා වේ
(3) කිරලා, ලලිතරාග තාල, මයුරා වේ
(4) ශුද්ධතාලය, ගණපති, කොවුලා වේ
(5) නළුගීතිකා, නාගගජගා, මයුරා වේ. (.....)

(03) තම්මැට්ටමේ මණ්ඩමේ මුහුණතේ විෂ්කම්භය හා අඩබෑයේ විෂ්කම්බය පිළිවෙලින් දක්වෙන වරණය වන්නේ,
(1) එක්වියතක් දෑගුලක් හා එක්වියතක් එක් අඟුලක් වේ
(2) තුන්වියතක් දෑගුලක් හා එක් වියතක් එක් අගුලක් වේ.
(3) එක්වියතක් හා තුන්වියතක් වේ.
(4) එක්වියතක් තුන්ගුලක් හා එක් වියතක් දෑ ගුලක් වේ.
(5) එක්වියතක් තුන්ගුලක් හා දෑවියතක් වේ. (.....)

(04) වීරත්වය දනවන අයුරින් නිර්මාණය වූ සිංහල මුල්ම හටන් කාව්‍ය ලෙස පිළිගැනෙන්නේ,
(1) ඉංග්‍රීසි හටන ය
(2) පරංගි හටන ය
(3) ඇහැලේ පොළ හටන ය
(4) කුස්තන්නීනූ හටන ය
(5) ලන්දෙසි හටන ය (.....)

(05) රසභාව පිළිබඳ පෙරදිග මත වාදිහු වන්නේ,
(1) ප්ලේටෝ හා නන්දිකේෂ්වරය
(2) භරතමුනි හා ස්‍රොක්‍රටීස් ය
(3) භරතමුනි හා නන්දිකේෂ්වර ය
(4) උද්ගමධනංජය හා ස්‍රොක්‍රටීස් ය
(5) ප්ලේටෝ හා ආනන්ද වර්ධන ය. (.....)

(06) ''රෙගත දෙගත ගදිගත ගුම් දම් දෙගතම් රෙගත දිකුද දැහිම්'' බෙර පදයෙන් තාණ්ඩව ගති ලක්ෂණයෙන් යුතුව සභාගත වන්නේ,
(1) කලු යකා ය
(2) අභිමාන යකා ය
(3) තොට යකාය
(4) රිරි යකා ය
(5) සුනියම් යක්ෂණී ය (.....)

(07) ''හෙල ගී මඟ' හා ''සිංහල තිත් තාල ක්‍රමය'' ග්‍රන්ථ රචනා කරනු ලද ප්‍රවීන ශිල්පීන් වන්නේ,
(1) ජේ.ඊ. ගුණසේන හා සරත් විජේවර්ධනය
(2) ඩබ්.බී. මකුලොලුව හා වින්සන්ට් සෝමපාලය
(3) ජේ.සී. මාලාගම්මන හා ජේ.ඊ. ගුණසේන ය
(4) වින්සන්ට් සෝමපාල හා ජේ.ඊ. සේදරමන්
(5) ඩබ්.බී. මකුලොලුව හා සරත් විජේවර්ධන (.....)

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

(08) කරුණා, රෞද්‍ර සහ අද්භූත යන රසයන්ගෙන් නිෂ්පන්න වන භාවයන් දැක්වෙන්නේ
(1) භය , ක්‍රෝධ සහ ශෝක ය (2) ශෝක, ක්‍රෝධ සහ විශ්මය ය
(3) ක්‍රොධ, ශෝක සහ භය ය (4) රති, ශෝක සහ විශ්මය ය
(5) ශෝක, භය සහ ක්‍රෝධ ය (.....)

(09) වලියක් මංගල්‍යය සහ කිරිමඩුව ශාන්තිකර්ම වලට ආවේණික සැරසිලි ලෙස දැක්වෙන්නේ පිළිවෙළින්,
(1) ගවරමල සහ නුග අත්තය (2) සිව්ලිය සහ ගවරමල ය
(3) නුග අත්ත සහ ගවරමල ය (4) පිදේනි තටු සහ සොලෙස්මලඟලය
(5) සොලොස්මගල සහ සිවිලිය ය (.....)

(10) කඨිනා බලිය සහ සුභූති බලිය යන බලි යොදා ගනු ලබන්නේ,
(1) වර්ෂාව ලබාගැනීමේ අපේක්ෂාවෙනි (2) දරුගැබ ආරක්ෂා කිරීමේ අපේක්ෂාවෙනි
(3) කඨින උත්සව අවස්ථාවේ ය (4) අපල දුරු කිරීමය
(5) වර්ෂාව අපේක්ෂාවෙනි. (.....)

(11) අනුරාධපුරය පොලොන්නරු යුගවල නර්තන කලාව පිළිබඳ සාධක දැක්වෙන මූලාශ්‍ර ලෙස සැලකෙන්නේ,
(1) චූලවංශය සහ කඳවුරු සිරිත ය. (2) මහාවංශය සහ දඹදෙණි අසන ය.
(3) මහවංශය සහ චූලවංශය ය. (4) සිංහල ථූපවංශය සහ උම්මග්ග ජාතක ය.
(5) දීපවංශය සහ කව්සිළුමිණ ය. (.....)

(12) සළු පාලියෙන් සහ රීරි යකාගෙන් උද්දීපනය වන රසය වන්නේ පිළිවෙළින්,
(1) හාස්‍ය සහ වීර ය. (2) ශාන්ත සහ රෞද්‍ර ය.
(3) ශෘංගාර සහ භයංකාර ය. (4) හාස්‍ය සහ භයානක ය.
(5) ශාන්ත සහ වීර ය. (.....)

(13) ඉද්ද, රොද්ද, වවුන්න, වෙල්ලිය ආදී උපකරණ භාවිතය ගන්නා නර්තනාංගය වන්නේ,
(1) වඩිගපටුන ය. (2) දොළහ පෙළපාලිය ය.
(3) දරු නැලවිල්ල ය. (4) නානුමුරය ය.
(5) කපුයක්කාරි ය. (.....)

(14) ''ගත ගුම්.....රිමි ගත ගදිගත ගදිත ගතම් ගත්තම් ගදිත ගතම් ගත දොම් ඟුද ඟුදිතකු දොම්''
බෙර පදයෙන් සභාවට පිවිසෙන්නේ,
(1) ජසයා ය. (2) ලෙංචිනා ය.
(3) මුදලි ය. (4) අණබෙරය.
(5) පුරන් සිනාය. (.....)

(15) මහනුවර කවිකාර මඩුවේ වන්නම් ගායනා කරනු ලැබුයේ,
(1) II රාජසිංහ රජු කාලයේ ය. (2) ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ කාලයේ ය.
(3) පළවෙනි විමලධර්මසූරිය කාලයේ ය. (4) I රාජසිංහ රජු කාලයේ ය.
(5) ශ්‍රී වික්‍රමසිංහ රජු කාලයේ ය. (.....)

(16) බලි ශාන්තිකර්මයේදී සිකුරු සහ ඉරු ග්‍රහයාට හිමි වර්ණ ලෙස හඳුන්වන්නේ,
(1) නිල් සහ රතු පැයැය යි. (2) සුදු සහ රත් පැහැය යි.
.(3) දම් සහ රන් පැහැය යි. (4) සුදු සහ දම් පැහැය යි.
(5) නිල් සහ දම් පැහැය යි. (.....)

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

17) ''කෙළි නළු බලන්නාහු සතුටු ව සිනාසුව මනා තන්හි දී සිනාසෙති'' ලෙස සඳහන් වන්නේ,
(1) දඹදෙනි අස්නෙ ය. (2) කව්සිළුමිණේ ය.
(3) එළු අත්තනගලු වංශයේ ය. (4) ථූපවංශයේ ය.
(5) සද්ධර්මරත්නාවලියේ ය. (.....)

(18) පටාචාරා කලාකෘතිය නිර්මාණ කළ ශිල්පිනිය හා චේදිකා ගත කළ වර්ෂය වන්නේ,
(1) වජිරා චිත්‍රසේන - 2014 වර්ෂයේ ය (2) අංජලිකා චිත්‍රසේන - 2014 වර්ෂයේ ය
(3) ජානකි හිල් - 2014 වර්ෂයේ ය (4) මිරැන්ඩා හේමලතා - 2014 වර්ෂයේ ය
(5) උපුලි පණිහාරත - 2014 වර්ෂයේ ය. (.....)

(19) පොළොන්නරු යුගයේ දී දේවදාසීන් පිළිබඳ ඓතිහාසික තොරතුරු දැක්වෙන්නේ,
(1) කොරවක්ගල සෙල්ලිපියේ ය. (2) සැස්සේරුව සෙල්ලිපියේ ය.
(3) කාලිංග උද්‍යාන සෙල්ලිපියේ ය. (4) පාලමොට්ටයි සෙල්ලිපියේ ය.
(5) අනුරූ සෙල්ලිපියේ ය. (.....)

(20) කථකලි සහ මණිපූරි නර්තනයේ ප්‍රවර්ධනයට දායක වූ ශිල්පින් දෙදෙනෙක් පිළිවෙලින් දැක්වෙන්නේ,
(1) චින්තයියා සහ රබින්ද්‍රනාත් තාගෝර් ය
(2) රහින්ද්‍රනාත් තාගෝර් සහ වල්ලතොල්නාරයන මෙනන් ය
(3) වල්ලතොල් නාරායන මෙනන් සහ රබින්ද්‍රනාත් තාගොර් ය
(4) ජිනදාස වික්‍රමසිංහ සහ චින්තයියා ය
(5) ක්‍රිෂ්න අයියර් සහ මීනාත්ෂි සුන්දරම් පිල්ලේ ය (.....)

(21) කාව්‍ය කරණයේදී සදෘස්මත් ලෙස හඳුන්වනු ලබන්නේ,
(1) ලඝු සහ ගුරු මාත්‍රාවල එකතුව යි (2) ලඝු සහ ගුරු අත්වල එකතුව යි
(3) ගුරු මාත්‍රා සහ හල් අක්ෂරවල එකතුව යි (4) ගුරු අක්ෂරවල එකතුව යි
(5) ලඝු අක්ෂරවල එකතුව යි (.....)

(22) මාත්‍රා 3 + 3 තාල රූපයට සමාන හින්දුස්ථාන් තාලය වන්නේ,
(1) ත්‍රිතාල් ය (2) ඣප්තාල් ය
(3) ධමාර් ය (4) කෙහෙර්වා ය
(5) දාදරා ය (.....)

(23) ගජ්ජිත් තත් ජිංතක තරිකිට
ගජිත් තුදක් ජිකු තක තරිකිට'' මෙම කස්තිරම තාල් තැබීමට හැකි තාල රූපය වන්නේ,
(1) 1 2 / 1 2 / 2 3 / 1 2 3 (2) 1 2 / 1 2 / 1 2 / 1 2 3 / 1 2 3
(3) 1 2 / 1 2 / 1 2 / 1 2 3 4 / 1 2 3 4 (4) 1 2 / 1 2 / 2 3 / 1 2 3 4
(5) 1 2 / 1 2 / 1 2 / 1 2 / 1 2 3 4 (.....)

(24) කථක් සහ භරත නර්තන සම්ප්‍රදායන්ට යොදාගන්නා අවනද්ධ භාණ්ඩ පිළිවෙලින්,
(1) තබ්ලාව හා පුං ය (2) වෙන්ඩාව සහ පුං ය
(3) මෘදංගය හා තබ්ලාව ය (4) පක්වාජ් සහ මෘදංගය ය
(5) පුං හා මද්ධලය ය (.....)

(25) ඉන්දියානු ආභාසය සහිතව 30 දශකයේ නිර්මාණයවූ මුද්‍රා නාට්‍ය දෙකකි,
(1) නලදමයන්ති සහ සිතාහරණ ය (2) ශිවරංග සහ නලදමයන්ති ය
(3) සිතාහාරණ සහ මනෝහරබන්ධනම් ය (4) ඡද්දත්තදායම් සහ ශිවරංග ය
(5) සිතාහරණ සහ ශිව රංග ය (.....)

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

❖ අංක 26 සිට 35 තෙක් දී ඇති ප්‍රශ්න වල එක් එක් වාක්‍යයේ හිස්තැන් පුරවන්න.

(26) බැරිසිල් මුද්‍රා නාට්‍යය නිෂ්පාදනය කරන ලද්දේ ..... විසිනි

(27) බලි ශාන්තිකර්මයේදී ඇඳුරා වම් අතට තාල් තැබීමට .....භාවිත කරයි.

(28) මාතර ප්‍රදේශයේ දී රිද්දි යාගය පැවැත්වීමට ප්‍රථම රෝග ලක්ෂණ අනුව..... බඳිනු ලබයි.

(29) ලංකාවේ පැවැති වාද්‍ය භාණ්ඩ වර්ගීකරණය පිළිබඳ ප්‍රථම වරට සඳහන් වන්නේ .....ය

(30) දඹදෙණි යුගයේ උගත් කලාවන් ගැන දක්වන විට ''භරත'' යන්න ..... සඳහන් වේ.

(31) නෘත්‍යරත්නාකරය'' කෘතිය රචනා කරන ලද්දේ .....මහතා ය.

(32) වලියක් මංගල්‍ය රංග භූමියේ හරිමැද වහලයේ බාල්කයේ ..... සැරසිල්ල එල්ලා ඇත.

(33) රිද්දි යාග මන්ඩපයේ නායක බිසව වෙනුවෙන් .....තොරණ සකසයි.

(34) 14 වැනි ලුවි රජු ප්‍රථම වරට ..... නර්තන පුහුණු පාසල ආරම්භ කරන ලදී

(35) ඔස්ට්‍රේලියානු ග්‍රෝත්‍රික ජනයා පිරිමි දරුවන් වැඩිවිය පැමිණීම අරඹයා ..... නැටුම රඟ දක්වයි.

❖ අංක 36 සිට 50 තෙක් ප්‍රශ්නවලට අදාළ පිළිතුර තිත් ඉර මත ලියන්න.

(36) දරුනැලවිල්ල සහ පොත්කඩේ යක්කම පෙළපාලි අංග ඇතුළත් ශාන්තිකර්ම කවරේ ද?

(i) දරුනැලවිල්ල - .....

(ii) පොත්කඩේ යක්කම - .....

(37) සුලකු සහ අරවිවෙට්ටු ද්‍රවිඩ ගැමිනැටුම් වලට සමාන සිංහල ජන නැටුම් සඳහන් කරන්න.

(i) සුලකු - .....

(ii) අරවිවෙට්ටු - .....

(38) ස්ථිතික හා සංචාරි චලන යනු මොනවා ද?

(i) ස්ථිතික චලන - .....

(ii) සංචාරි චලන - .....

(39) පහත සඳහන් A සහ B රූපවල දැක්වෙන ශාන්තිකර්ම සැරසිලි නම් කරන්න.

A

B 

(i) A - .....

(ii) B - .....

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

(40) ''අසලා කීවේ වගතුග සියල්ලක්
යොදාලා කීවේ බොරු බස් ඇසිල්ලක්''
මෙම කවිය අයත් ශාන්තිකර්මය හා නාට්‍යමය පෙළපාලිය නම් කරන්න.

(i) ශාන්තිකර්මය - .....

(ii) නාට්‍යමය පෙළපාලිය - .....

(41) භාරත නාට්‍යම්හි දේවාදාසීන් පුහුණු කරන්නා හා වේෂ නිරූපණ ශිල්පියා නම් කරන්න.

(i) පුහුණුකරන්නා - .....

(ii) වේෂනිරූපණ ශිල්පියා - .....

(42) සියොපත් පතිනේ දිගු නුවනතිනේ'' මෙම කවිය අයත් ශාන්තිකර්මය සහ නර්තනාංගය කුමක් ද?

(i) ශාන්තිකර්මය - .....

(ii) නර්තනාංගය - .....

(43) හංස වන්නම රචනා කරන ලද ශිල්පියා සහ රංග විනාසය කරන ශිල්පියා නම් කරන්න.

(i) රචනා කිරීම - .....

(ii) රංග විනාසය - .....

(44) නරිබැණා සහ කුවේණිය ශෛලිගත නාට්‍ය නිර්මාණ ශිල්පින් නම් කරන්න.

(i) නරි බැණා - .....

(ii) කුවේණි - .....

(45) බලි ශාන්තිකර්මය බෞද්ධාගමික පසුබිමක් නිර්මාණය කිරීමේ පුරෝගාමී හිමිවරුන් කවුරුන් ද?

(i) .....

(ii) ....

(46) මහබෝ වන්නම හා නලගන වන්නම නිර්මාණය කරන ලද්දේ කවුරුන් විසින් ද?

(i) මහබෝ වන්නම- .....

(ii) නලගන වන්නම - .....

(47) සැළලිහිණිය සහ තිසර සංදේශ කාව්‍ය අයත් වන්නේ පිළිවෙලින් කුමන යුගවලට ද?

(i) සැළලිහිණිය - .....

(ii) තිසරය - .....

(48) උඩැක්කිය සහ තම්මැට්ටම සඳහා භාවිත කළහැකි වෙනත් නම් දක්වන්න.

(i) උඩැක්කිය - .....

(ii) තම්මැට්ටම - .....

(49) වෙස්මෝස්තර රචනයට අයත් ප්‍රධාන කොටස් 2 ක නම් කරන්න.

(i) .....

(ii) ....

(50) ''ඉනේ සවඩි රන් කෙදිවන් - පයේ ගිගිරි වළලු ලවන්'' මෙම කවිය අයත් ශාන්තිකර්මය හා නර්තනාංගය නම් කරන්න.

(i) .....

SLGURU.LK

(ii) .....

For Educational Purpose Only

SLGURU.LK

ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone

ගම්පහ අධ්‍යාපන කලාපය
Gampaha Education Zone

දෙවන වාර ඇගයීම - 2025
Second Term Evaluation - 2025

ශ්‍රේණිය Grade	12	විෂයය Subject	නර්තනය (දේශීය) II (52)	කාලය Time	පැය 03

නම : .....

- ❖ මෙම ප්‍රශ්න පත්‍රය i, ii හා iii වශයෙන් කොටස් තුනකින් සමන්විත වේ.
- ❖ i කොටසේ 1 හා 2 ප්‍රශ්න අනිවාර්ය වේ.
- ❖ ii හා iii කොටස්වලින් අවම වශයෙන් එක් ප්‍රශ්නය බැගින් තෝරාගෙන අනිවාර්ය ප්‍රශ්න දෙකද ඇතුලුව ප්‍රශ්න පහකට පිළිතුරු සැපයිය යුතුය.

I කොටස

(01) (i) පහත සඳහන් බෙර පද අතුරෙන් ඔබ උගත් සම්ප්‍රදායට අයත් බෙර පදය තෝරාගෙන ප්‍රස්තාර කරන්න.

දෝං ජිං ජිං තකට දොංතක
දිත් තම් දිතකු දොම් දොම් තාම්
කුදත් තක්කිට තකට ජිමිතක

(ii) පහත සඳහන් කවි පදය මහතනි තිතට (4 + 4) ප්‍රස්තාර කරන්න.

''සැපත පැමිණි මුලු ලොවට සියල්ලේ''

(iii) ගණපති වන්නමේ අඩවිව හෝ ශුද්ධ තාලය සින්දුවන්නමේ ඉරට්ටිය හෝ කොවුලා වන්නමේ අඩවිව හෝ ප්‍රස්තාර කරන්න.

(02) දේශීය නර්තන කලාවේ ඓතිහාසික තොරතුරු, සාහිත්‍ය හා පුරා විද්‍යා මූලාශ්‍ර අධ්‍යනය කිරීමෙන් හෙලි වේ.

(i) අනුරාධපුර යුගයේ නර්තන කලාවේ තත්ත්වය පිළිබඳ පුරාවිද්‍යා මූලාශ්‍ර දෙකක් ඇසුරෙන් පෙන්වා දෙන්න.

(ii) පොළොන්නරු යුගයේ නර්තන කලාවට රාජ්‍ය අනුග්‍රහ ලැබූ අයුරු වංශකතා දෙකක් ඇසුරෙන් විස්තර කරන්න.

(iii) දඹදෙණිය සහ කුරුණෑගල යුගවල භාවිත වාද්‍ය භාණ්ඩ පිළිබඳ තොරතුරු සාහිත්‍ය කෘති දෙකක් ඇසුරෙන් විමසීමට ලක්කරන්න.

II කොටස

(03) දේශීය ශාන්තිකර්ම විවිධ ඇදහිලි විශ්වාස මෙන්ම චාරිත්‍ර විධිවලින් සමන්විත වේ

(i) කිරිමඬුව ශාන්තිකර්ම පැවැත්වීමේ අරමුණු පැහැදිලි කරන්න.

(ii) වලියක් මංගල්‍ය ශාන්තිකර්මයෙන් නිරූපිත සමාජීය විශ්වාස පිළිබඳ විග්‍රහයක් කරන්න.

(iii) රටයකුම ශාන්තිකර්මයේ අරමුණු පැහැදිලි කර නානුමුර පෙළපාලි අංගයේ විශේෂතා පිළිබඳ විමසීමක් කරන්න.

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

(04) දේශීය ශාන්තිකර්මවල නාට්‍යමය පෙළපාලි හා සැරසිලි රංග භාණ්ඩ දක්නට ලැබේ.

(i) වලියක් මංගල්‍යය ශාන්තිකර්මයට ආවේණික සැරසිලි 3ක් නම් කරන්න.

(ii) ඌරා යක්කමේ චරිත නිරූපණය විචාරයට ලක් කරන්න.

(iii) බලි ශාන්තිකර්මයේ ආවේණික ඇඹුම් ශිල්පක්‍රම හා වර්ණ ගැන්වීම් පිළිබඳ විස්තර කරන්න.

(05) (i) ගැමි නැටුම් මගින් ගැමි ඇදහිලි හා විශ්වාස පිළිබඳ විවරණය කරයි. ගායනා දෙකක් ඇසුරෙන් විමසන්න.

(ii) ගැමි නැටුම් මගින් සමාජ සහයෝගය මෙන්ම සාරධර්ම සංවර්ධනය වේ. විමසන්න.

(iii) කෝලම් නාටක චරිත මගින් සමාජ දුෂ්චරිත උපහාසයට ලක් කරයි. චරිත දෙකක් ඇසුරෙන් විමසන්න.

II කොටස

(06) (i) උතුරු ඉන්දීය නර්තන සම්ප්‍රදායන් නම් කර එම සම්ප්‍රදායන් ප්‍රචලිත ප්‍රදේශ 2 ක් ප්‍රධාන වාද්‍ය භාන්ඩ, නර්තන අංග දෙකක් නම් කරන්න.

(ii) පටාචාර මුද්‍රා නාට්‍යයේ භාවිත නර්තන ශෛලීන් සහ රංග වස්ත්‍ර පිළිබඳ විස්තර කරන්න.

(iii) භරත නාට්‍යම් සම්ප්‍රදායේ ආරම්භය හා විකාශය පිළිබඳ විමසීමක් කරන්න.

(07) (i) රූපවාහිනිය මගින් විකාශනය වන නර්තන වැඩසටහන් 3ක් නම් කරන්න.

(ii) රියැලිටි නර්තන තරග සඳහා විදේශීය ආභාස ලැබී ඇති ආකාරය නර්තන හා රංග වස්ත්‍ර ඇසුරෙන් විමසන්න.

(iii) රියැලිටි තරග පැවැත්වීමෙන් දේශීය නර්තනයට සිදුවිය හැකි බලපෑම පිළිබඳ විචාරයට ලක් කරන්න.

(08) නර්තන හා අනෙකුත් සෞන්දර්ය කලා අතර මනා සබඳතාවක් පවතියි.

(i) ප්‍රාසාංගික නර්තන නිර්මාණයක් සඳහා සංගීත කලාවෙන් ලැබෙන දායකත්වය පිළිබඳ විස්තර කරන්න

(ii) චිත්‍ර කලාවේ මූලිකාංග නර්තන කලාව හා බැඳී පවතියි. විමසන්න.

(iii) දේශීය මුද්‍රා නාට්‍ය කලාව ආරම්භය හා විකාශය පිළිබඳ විමසීමක් කරන්න.

SLGURU.LK
For Educational Purpose Only

“Live as if you were to die tomorrow. Learn as if you were to live forever.” — Mahatma Gandhi

Visit SLGURU.LK to download papers and notes.